සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

අනාවරණ පරීක්ෂණය | පැය 02 යි
கண்டுபிடிப்பு சோதனை | 02 மணி நேரம்
Diagnostic Test | 02 Hours

සිංහල භාෂාව හා සාහිත්‍යය 111 | 11ශ්‍රේණිය
சிங்கள மொழி மற்றும் இலக்கியம் 111 | தரம் 11
Sinhala Language and Literature 111 | Grade 11

- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 01 , 02 , 03 , 4 ප්‍රශ්නවලටත් 05 , 06 , 07 ප්‍රශ්නවලින් එකකටත් අත්තර ලියන්න.

(i) සිට (x) තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි පිළිතුරු ලියන්න.කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න .

01)

i. අ. ජාතක කතා පොත රචනා වුයේ කුමන අවධියක ද ?
ආ. ජාතක කතා පොතේ ඇති දීර්ඝතම කතාව කුමක්ද ?

ii. “අප හා එක් වන්නාට දුව පාවා දෙමි.”
අ. කවරෙකු විසින් මෙම ප්‍රකාශය කරන ලද්දේද ?
ආ. මෙම ප්‍රකාශය අන්තර්ගත කතාව කුමක්ද ?

iii. පටන් සුරිඳු දුන් උපදෙස් සිහි කොට
ඉටන් බෙලෙන් දැමුවෙන් ගුළි අහසට
.........................................................
.........................................................
අ. මේ කවියේ ඉතිරි පද දෙක සම්පුර්ණ කරන්න.
ආ. මෙම කවිය අයත් පාඩමේ නම ලියන්න.

iv. “ශිල්පයට උපචාර කොටැ දැළි කප්වා නහා පිළි පෙරළා මවුපියන් දක්මි”
අ. මෙසේ සිතන්නේ කවුද ?
ආ. මෙම පාඨය අන්තර්ගත කෘතිය කුමක්ද ?

v. අ: කුණාටුව ’ කාගේ නිර්මාණයක්ද ?
ආ: මෙම රචකයා විසින් රචිත ඔබට අදාළ නිර්මාණය නම් කරන්න.

vi. පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට
ඇසෙයි ළමා වසුපැටියන් හඬ දුරට
දිසෙයි වෙහෙර එහි සුර විමනක් ලෙසට
රසෙයි අමා රසමය ඒ පියස දුට

අ. මෙම කවය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය නම් කරන්න.
ආ. එම කාව්‍ය ග්‍රන්ථය රචනා කරන ලද්දේ කවුරුන් විසින්ද ?

vii. සියලු බෝග වස්තු ඉසුරු
හරිනි නෙක් දනෝ
සව් සැප දෙන සිතුමිණ වන්
ප්‍රේමය සන්දා

අ. මෙම ගීත ඛණ්ඩය අයත් නාට්‍යය නම් කරන්න.
ආ. මෙහි දැක්වෙන උපමාව හා උපමේය වෙන් කොට දක්වන්න.

viii. තමන් ලැබු දිවි පෙවෙතේ
කොටසක් රට සමය වෙතේ
.........................................................
.............................................................

අ. මේ කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
ආ. එස් මහින්ද හිමියන් ලියූ මුල්ම කාව්‍ය කෘතියේ නම සඳහන් කරන්න.

ix. නහින දෙහින කාලෙට පින් කෙරුව යුත
වහින කලට කුරින් විල් වලින් එන
බහින දියෙන් දෝතක් මුත් ගතොත් ඇත
පනින රිලවුන්ට ඉනිමං <u>කමක්</u> නැත

අ. මෙම කවිය කුමන වර්ගයට අයත් කවියක්ද ?
ආ. මෙහි ඉරි ඇඳි පදයේ අර්ථය දක්වන්න.

x. "ඔව් ඕකට ගිය කෙනෙක් ආයෙ එන්නේ නෑ. උඹ පලයන් ළමයා ආපහු ගමට"

අ. කවරෙකු විසින් මෙම ප්‍රකාශය කරන ලද්දේද ?
ආ. මේ ප්‍රකාශය හා සබැඳි අවස්ථාව කුමක්ද?

( ලකුණු

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

i. "රජ්ජුරුවෝ වනාහි රාජ මානයෙන් ද ඉසුරු මදයෙන් ද මත්වැ දණ්ඩකින් පහරන ලද සර්ප රාජයෙකු සේ කෝපයෙන් දිළිහී"

අ. මෙම පාඨයේ සඳහන් උපමාව ලියන්න.
ආ. මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

ii. සතොස් කරන වීණා නද ඇසුමට
නොගොස් සිටින <u>පිල්බර ගණ</u> ගොදුරට
<u>වෙසෙස්</u> රුචින් තම මැව්වත් බඹහට
සඳැස් සවන් නොකළැයි ව නොසතුට

අ. මේ අවස්ථාවේ දෝෂාරෝපණයට ලක්වුයේ කවරෙක්ද ?
ආ. ඉරි ඇඳි පදවල අරුත් දක්වන්න.

iii. ශිල්පයට උපචාර කොටැ දැළි <u>කප්පවා</u> නහා <u>පිළී පෙරළා</u> මවුපියන් දක්මියි <u>අටවියට</u> වදනා තැනට අවුදු මගින් පහවැ සිටියෙ.

අ. මේ පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.
ආ. අංකිත පදවලට අර්ථ සපයන්න.

iv. "ඒවායේ හැමදාම බඩගින්න තමා.මං දන්නවා , මට මතකයි.ඒත් තමන්ගේ පැල්පතයි , මිදුලයි , කැපෙයි තමන්ට නිදහස තියෙනවා."

අ. මේ හා සම්බන්ධ අවස්ථාව කුමක්ද?
ආ. මෙහිදී අවතක්සේරුවට ලක්වන්නේ කවර පරිසරයක්ද?

v. මා පියා හැර දමා
යන්නෙ කෙලෙසදෝ
වලට ගොස් පීඩා වී
පැමිණි විට නැත කෙනෙක්
අහර පිස දෙන්නටා
හුදෙකලා මේ ලෙනේ
ඉන්නෙ ඔහු කෙලෙසදෝ

අ. මේ ගීතයේ සිංහ සීවලීගේ චරිතයෙහි කෙබඳු ලක්ෂණ ප්‍රකාශ වේද?
ආ. මෙහි සඳහන් පියාට මුහුණ පෑමට සිදුවන දුෂ්කරතා දෙකක් ලියන්න.

(ලකුණු 4 x 5 =20)

03. ගුත්තිල ජාතක කතාව කාව්‍යයට නැගීමේදී

i. වර්තමාන සරල වහරද
ii. කාව්‍යමය වියත් වහර ද
මනාව ගළපා ඇත.උදාහරණ දෙක බැගින් දක්වමින් මේ අදහස පැහැදිලි කරන්න.

නැතහොත්

i. චරිත සංවර්ධන සඳහා උපදේශ ලබාදීම
ii. දේශාභිමානය වර්ධනය කිරීම
මුනි සිරිපා සිඹිමින්නේ පද්‍ය පන්තියෙන් සිදු කරයි. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වා විමසන්න.

(ලකුණු 15)

04. උම්මග්ග ජාතකයේ මහෞෂධ පණ්ඩිතයන්ගේ

i. උපාය කෞශල්‍ය හා
ii. සානුකම්පිතභාවයත්
සිත් ගන්නා පරිදි ඉදිරිපත් කර ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වා විස්තර කරන්න.

නැතහොත්

i. සුප්පා දේවියගේ දාරක ප්‍රේමය
ii. සිංහසීවලිගේ පීතෘ ප්‍රේමය
නාට්‍යකරුවා නිරූපණය කොට ඇති අයුරු එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් සිංහබාහු නාට්‍යය ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 15)

05 , 06 , 07 යන ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.

05. පුද්ගල සංවර්ධනයට අවශ්‍ය බොහො දේ උග්ගස්සේන චරිතය තුළින් ලබා ගත හැකි වී ඇත.අදාළ පාඩමෙන් උදාහරණ තුනක් මගින් මෙම අදහස විමසන්න.

06. එච් .එම්.කුඩලිගම මහතා අජීවී පරිසරයට සජීවී බවක් ආරෝපණය කරමින් කවි පන්තිය රසවත් කරයි.ගංගාවේ සංගීතය කවි පෙළ ඇසුරෙන් විමසන්න.

07. බැද්දේගම හා එහි වැසියන් අභාවයට යන ආකාරය සජීවී ලෙස නිරූපණය කරන්නට කතුවරයා භාෂාව භාවිත කර ඇති අයුරු උදාහරණ තුන බැගින් ගෙන විස්තර කරන්න.

(ලකුණු 10)

සිංහල සාහිත්‍යය 111 පත්‍රය
පිළිතුරු

01)

i. අ. 14 වන සියවස / කුරුණෑගල යුගය
ආ. උම්මග්ග ජාතකය

ii. අ. විද්දත් දුවගේ පියා
ආ. උග්ගස්සේන නම් සිටුපුත්හුගේ කතා වස්තුව

iii. අ. තුටන් වඩන සුර අඟනෝ බැස සිට
පටන් ගත්තු නව සියයක් නැටුමට
ආ. ගුත්තිල වෙණ නද

iv. අ. අංගුලිමාල
ආ. අමාවතුර

v. අ. එච් එම් කුඩලිගම මහතා
ආ. ගංගාවේ සංගීතය

vi. අ. හංස සංදේශය
ආ. වීදාගම මෛත්‍රේය මාහිමි

vii. අ. සිංහබාහු
ආ. උපමාව - සිතුමිණ
උපමේය - ප්‍රේමය

viii. අ. පුද නොකොළොත් උ ඹෙන් පුතේ
මෙලොවට කිසි පලක් නැතේ
ආ. ඔවා මුතු

ix. අ. උපදේශාත්මක ජන කවි/ජනකවි
ආ. ප්‍රයෝජනයක් නැත.

x. අ. හිර ගෙදර අසල සිටි මහලු මිනිසා / මහල්ලා/සීයා
ආ. පුංචි මැණිකා ඔවුන් බැලීමට හිර ගෙදරට ගිය අවස්ථාව

02.

i. අ. සර්ප රජෙකු සේ
ආ. මහෞෂධ පඬිතුමාගේ රැකවල් ඇති මියුලු නුවර ජය ගැනීම අපහසු බවත්, එහි ගොස් පැරදී ලජ්ජාවට ලක්වන බවත් කේවට්ට බමුණා කී විට ඉන් කෝපයට පත් චුලනී බ්‍රහ්මදත්ත රජු මෙසේ පවසන ලදී.

ii. අ. මහා බ්‍රහ්මයා
ආ. මොනර සමුහයා
විශේෂ

iii. අ. ඇඟිලි දහස සම්පූර්ණ කර ගුරු පුජාව කොට රැවුල කපා ඇඳුම් මාරු කොට පිරිසිදු වී දෙමාපියන් බැලීමට යන්නෙමියි සිතූ අවස්ථාව
ආ. දැළි කප්පවා - රැවුල කපා
පිළී පෙරළා - ඇඳුම් මාරු කර
අටවිය - වනය

iv. අ. බැද්දේගම සිට පැමිණි පුංචි මැණිකාට හිර ගෙදර අසලදී හමුවන මහලු මිනිසා කැලෑබද ගම්වල තිබෙන නිදහස ගැන පැවසූ අවස්ථාව
ආ. සෝෂාකාරී බවින් යුතු නාගරික පරිසරය

v. අ. පියාට ඇති ආදරය ගෞරවය - පීතෘ සෙනෙහස
ආ. අහර පිසදෙන්නට කිසිවෙකු නොමැතිවීම